# කුඩා උපකාරශීලී

# කුහුඹුවා



වයි.එම් සෙතුණී යුවන්නියා දසනායක

# කුඩා උපකාරශීලී කුහුඹුවා

වයි.එම් සෙතුණි යුවන්නියා දසනායක

කතෘ

කතෘගේ වෙනත් කෘති-

නුවණක්කාර දඬුවම

මහාමායා බාලිකා විද්‍යාලය

3 වසර c

2026-05-10

## පිදුම

අපේ ආදරණීය විදුහල්පතිනි
ශෂිකලා සේනාධීර මහත්මියටත්,
පොත් වලට ආදරය කරන්නට
සෙනවිරත්න මහලේකම්තුමණ්‍යටත්,
අපට කතා ලියන්න උගන්වා දුන්
විජේකෝන් ගුරුතුමියටත්,

මෙම කුඩා කතා පොත
මම ආදරයෙන් පුදමි.



**පෙරවදන**

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සදහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10


# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍යා දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10


එක දවසක උදෑසන, රන්වන් හිරු එළිය වැටුණු පුංචි වත්තක් තිබුණා. ඒ වත්තේ පුංචි පුංචි කුහුඹුවෝ ගොඩක් ජීවත් වුණා. එහි සිටිය කුඩාම කූඹියා තමා හිඳු.



හිඳු පුංචි වුණාට, හිඳුගේ හිත හරිම හොඳයි. හැමදාම වගේ හිඳු අනිත් අයට උදව් කරන්න පුරුදු වෙලා හිටියා. අදත් තමන්ගේ පවුලට කෑම සොයාගෙන යන ගමන්.

හිඳු යද්දී, දැක්කා ලස්සන සූරියකාන්ත මලක් දුකෙන් හිස පහත් කරගෙන ඉන්නවා. හිඳු ඒ ළඟට දිව්වා. "මල් රැජිණියේ, ඔයාට මොකද වුණේ? ඇයි ඔයා දුකෙන් ඉන්නේ?" කියලා ඇහුවා.

මල් රැජිණ කිව්වා, "අනේ පුංචි හිඳු, බලන්න මගේ කොළ දිහා. පුංචි දළඹුවෙක් මගේ කොළ කාලා දාලා. ඒ නිසා මට හරියට අව්ව වැටෙන්නේ නෑ නේ මට පණ නෑ."



හිඳු ටිකක් හිතුවා. හිඳු පුංචි නිසා හිඳුට තනියම දළඹුවාව ඉවත් කරන්න බැහැ.

එතකොටම හොඳ අදහසක් ආවා........ හිඳු තණකොළ කොළයක් උඩට නැග්ගා. එයාගේ ඇන්ටෙනා දෙක සොලවමින් ඔහු අනිත් කුහුඹුවන්ට කතා කළා. "යාළුවනේ, ඉක්මනට එන්න. මල් රැජිණට උදව් ඕනෑ!"



හිඳුගේ කෑදවීම දැක්ක ගමන් කුහුඹුවෝ ගොඩක් එතැනට ආවා. කුහුඹු පැටව් ටික මල් රැජිණගේ කඳට නගින්න පටන් ගත්තා. හිඳු ඉස්සරහින් ගියා. ඔවුන් හෙමිහිට දළඹුවා වට කළා. දළඹුවාට පුදුම හිතුණා. "අනේ, මේ පුංචි කුහුඹුවෝ මොකද කරන්නේ?".




කුහුඹුවෝ දළඹුවාට කිසිම කරදරයක් කළේ නැහැ. හෙමිහිට අඩු වලින් අල්ලමින්, වෙනත් ගහකට යන්න උදව් කළා. හිඳු කිව්වා, "දළඹුවා, ඔයාට කන්න ඕන නම් ඒ පැත්තේ තියෙන පැළැටි කන්න පුළුවන්. ඒත් මේ මල් රැජිණ අපේ යාළුවා. එයාට රිද්දන්න එපා."

දළඹුවාට තමන් කළ වැරැද්ද තේරුණා. ඔහු හෙමිහිට බිමට බැහැලා අනිත් පැත්තේ ගහකට ගියා.



දළඹුවා ගිය ගමන්, මල් රැජිණට හරි සතුටක් දැනුණා. ඇය කෙළින් හිස ඔසවාගෙන, ඉර දෙස බලාගත්තා. ඇගේ කොළ වලට ආයෙත් පණ ආවා. මල් රැජිණ පහත්වෙලා හිඳුට කිව්වා, "බොහොම ස්තූතියි පුංචි හිඳු. ඔයා පුංචි වුණත් ඔයාගේ උදව්ව හරිම ලොකුයි. ඔයා නැතුව මට ඉරඑළියට එන්න වෙන්නේ නෑ."

හිඳුට ලැජ්ජා හිතුණාට ගොඩක් සතුටුයි.



හිඳු ගෙදර යන ගමන්, ඒ දළඹුවාව දැක්කා. ආයෙමත් වෙන පැළෑටියක කොළ කමින් හිටියා. ඔහු හිඳුව දැකලා හිනාවුණා. "සමාවෙන්න, මම කළේ වැරැද්දක්. ඔයා මට හොඳ පාඩමක් ඉගැන්නුවා. අපි දැන් යාළුවෝ වෙමු ද?" කියලා දළඹුවා ඇහුවා.

හිඳුට ගොඩක් සතුටුයි. "මම කැමතියි!"

ඉතින් ඒ දවසේ ඉඳන්, ඒ වත්තේ හැමෝම සාමයෙන් ජීවත් වුණා. මල් රැජිණ හැමදාම ඉරදෙස බලා සිනාසුණා. කුඩා හිඳු සහ ඔහුගේ යාළුවෝ හැමෝටම උදව් කරමින් සතුටින් ජීවත් වුණා. පුංචි වැඩේ ලොකු මිතුරුකම් ඇති කළා. කුඩා උදව්වක් වුණත් ලෝකය වෙනස් කරන්න පුළුවන් කියලා හිඳු ඔප්පු කළා.

අපි කොච්චර පුංචි වුණත්, අපේ කාරුණික හදවතින් සහ එකමුතුකමෙන් අපිට ලොකු ලොකු දේවල් කරන්න පුළුවන්. අනුන්ට උදව් කරන එකෙන් අපිට නව මිතුරන් ලබාගන්නත් පුළුවන්.



අවසානයි.

**පසුවදන**

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් හේමමාලා උපහාරං ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

978-624-208-982-9